# දරුවන් උදෙසා බයිබලයක්



# සුරූපි බිසව, එස්තර්

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

වරක් එස්තර් නම් ශෝභමාන දැරියක් සිටියාය. ඇගේ පියා සහ මව මිය ගිය විට, එස්තර්ගේ ඥාති සොහොයුරෙකු වූ මොර්දෙකයි ඇයව ඇති දැඩි කළේය. එස්තර් තම ඥාති සොහොයුරාට හොඳ දියණියක් ලෙස කීකරු වීමෙන් ගෞරව කළාය.





එස්තර් ජීවත් වූයේ පර්සියාවේ ය. නමුත් එස්තර් පර්සියානු
ජාතික ස්ත්‍රියක් නොවූවාය. ඇය යුදෙව් ජාතික ස්ත්‍රියක්
වූවාය. ඇගේ මුතුන් මිත්තන් පර්සියාවට පැමිණියේ යුධ
සිරකරුවන් ලෙසය. එස්තර්ගේ කාලයේ බොහෝ
ජුදෙව්වෝ පර්සියාවේ ජීවත් වූවෝය.

පර්සියාවේ රජු ලොව පුරා සිටින කුමාරවරුන් සදහා විශාල භෝජන සංග්‍රහයක් පැවැත්වූයේය. වස්තී බිසව සමඟ භෝජන සංග්‍රහයේ සිටි ස්ත්‍රීන් වෙනමත්, පුරුෂයෝ වෙනමත් හිදිමින් ආහාර ගත්තෝය. බීමත්ව සිටි රජතුමා වස්තී බිසවට රාජකීය ඔටුන්න පළදා ඇගේ අලංකාරය පෙන්වන ලෙස නියෝග කළේය. නමුත් වස්තී බිසව එය ප්‍රතික්ෂේප කළාය.



කාන්තාවන් තම
ස්වාමිපුරුෂයන්ට ගෞරව
කළ යුතු බව පෙන්වීමට රජු
නීතියක් සම්මත කර ඒ
තුළින් වස්තී බිසවගේ
ඔටුන්න නැවත ගත්තේය.
ඇය තවදුරටත් රැජින
නොවීය.



නව රැජිනක්
සෙවීම සිදු කරන ලදී.
රාජධානියේ සිටි සියලුම
රූමත් තරුණියන් අතරින්
රජු තම බිරිඳ ලෙස එස්තර්ව
තෝරා ගත්තේය. ඔහු රාජකීය
ඔටුන්න ඇගේ හිස මත
තැබුවේය. එස්තර් තමා
යුදෙව්වෙක් බව රජුට
නොකීවාය. ඒ, ඇගේ ඥාති
සොහොයුරා ඇයට එසේ
නොකියන මෙන් අවවාද
කර තිබුණු බැවිනි.





ඥාති සොහොයුරු මොර්දෙකයි එස්තර් ගැන දැන ගැනීමට මාලිගාවේ දොරටුව අසල කාලය ගත කළේය. දිනක් මාලිගාවේ සේවකයන් දෙදෙනකු රජු ඝාතනය කිරීමට සැලසුම් කරන අයුරු ඔහුට ඇසිණි. මොර්දෙකයි අනතුරු ඇඟවීම කර රජුගේ ජීවිතය බේරාගත්තේය. සේවකයන්ව එල්ලා මරා දැමූ අතර, මොර්දෙකයිගේ නම රජුගේ වාර්තා පොතේ ලියැවුණේය.

රජුට දෙවැනියා වූයේ හාමාන් නම්
ධනවතාය. හාමාන් පසුකර යන විට
සියල්ලෝම වැඳ වැටුණෝය. නමුත් එක්
මිනිසෙක් පමණක් එසේ නොකළේය.
ජුදෙව්වෙකු ලෙස මොර්දෙකයි නමස්කාර
කළේ ජීවමාන දෙවියන් වහන්සේට පමණි.



හාමාන් මොර්දෙකයිට වෛර කළ නිසා ඔහු, මොර්දෙකයි ඇතුලු පර්සියාවේ සියලුම ජුදෙව්න් මරා දැමීමට තීරණය කළේය. මොනතරම් භයානකද? දුෂ්ට හාමාන්, රජතුමා රවටා යම් අවස්ථාවකදී රාජ්‍යයේ සිටින සෑම ජුදෙව්වෙකුම මරා දමන්නට හැකිවන සේ නීතියක් අත්සන් කළේය.





එය ඉතා භයානක
නීතියක් විය. ජුදෙව්වෝ මෙන්ම
පර්සියානුවෝද වැලපුණෝය.
නමුත්, දෙවියන් වහන්සේ විසින්
එස්තර්, රැජින බවට පත් කර
ඇති බව අමතක නොකළ
යුතුය. ඒ වගේම ඇය ජුදෙව්
ජාතික ස්ත්‍රියක් වූවාය. ඇය
තමා ගැන ඇති ඒ රහස තව
දුරටත් රජුගෙන් වසන් කරාවිද?
එසේත් නැතිනම්, ඇය තම
ජනතාව බේරා ගැනීමට ජීවිතය
පවා අවදානමට ලක්කොට
උත්සාහ කරාවිද?

දෙවියන් වහන්සේ එස්තර්ට නුවණැති අදහසක් දුන් සේක. ඇය රජුටත් හාමාන්ටත් භෝජන සංග්‍රහයක් සූදානම් කළාය. එහිදී ඇය ඉල්ලන ඕනෑම දෙයක් දෙන්නට රජු ඇයට පොරොන්දු විය. “රජතුමා හා හාමාන් දෙදෙනාම හෙටත් භෝජන සංග්‍රහයට එන්නයැ”යි එස්තර් පිළිතුරු දුන්නාය. එහිදී ඇය තමාට අවශ්‍ය දේ රජුට පවසනු ඇත.



මේ අතර හාමාන් මොර්දෙකයි
එල්ලා මැරීමට විශාල එල්ලුම්
ගහක් සූදානම් කළේය.



එදා රාත්‍රියේ රජුට නින්ද ගියේ නැත. නඩු වාර්තා කියවන විට ඔහු තම ජීවිතය බේරාගත් මොර්දෙකයි ගැන ලියැවී තිබෙනු දටුවේය. නමුත් ඒ වෙනුවෙන් මොර්දෙකයි හට කිසි දිනක ත්‍යාගයක් නොලැබුණු බවද ඔහු දැනගත්තේය. පසුදා උදෑසන රජු හාමාන්ගෙන් "රජු විසින් ගෞරව කිරීමට කැමති මිනිසාට කුමක් කළ යුතුද?"යැ ඇසුවේය. හාමාන් සතුටු විය.



ඔහු සිතුවේ රජු අදහස් කරන්නේ ඔහු ගැන බවයි.

හාමාන් මොර්දෙකයි එල්ලා මැරීමට රජුගේ අවසරය ඉල්ලා ගැනීම පිණිස පැමිණ සිටියේය. එල්ලුම් ගහ සූදානම්ව තිබුණි. හාමාන් උද්යෝගිමත් ලෙස ඔහුගේ යෝජනා පැවසුවේය: “රජුගේ වස්ත්‍රයෙන් සහ ඔටුන්නෙන් ඒ මනුෂ්‍යයා සරසන්න.”





“ඔහු රජුගේ අශ්වයා පිට හිඳවන්න. සියලු
දෙනාට පෙනෙන පරිදි එම පුද්ගලයා
නගරය මැදින් ගෙන යන ලෙස රාජකීය
කුමාරයෙකුට අණ කරන්නයැ”යි ඔහු
කීවේය. “එසේනම් ඉක්මන් කර ජුදෙව්
ජාතික මොර්දෙකයිට එසේ කරන්න”
කියා රජු හාමාන්ට
අණ කළේය.

මොර්දෙකයිව ගෞරවනීය ලෙස
නගරය වටා ගෙන යද්දී හාමාන්ට හැඟුණේ
කෙසේදැයි ඔබට සිතාගත හැකිද? ඔහු
පෙරටත් වඩා මොර්දෙකයිට වෛර කළේය.
“මදක් ඉවසන්නම්” හාමාන් සිතන්න ඇති.
“අනෙකුත් සියලුම ජුදෙව්වන් සමඟ
ඔහු ඉක්මනින්
මිය යනු
ඇත.”



එදිනම හාමාන් සහ රජු එස්තර් රැජිනගේ භෝජන සංග්‍රහයට පැමිණියෝය. “ඔබේ ඉල්ලීම කුමක්ද?” රජතුමා ඇසුවේය. ඔහු තම පොරොන්දුව අමතක කර නැත. එස්තර් රැජින හාමාන්ට ඇඟිල්ල දිගු කරමින් හාමාන්ගේ දුෂ්ට කුමන්ත්‍රණය ගැන රජුට පැවසුවාය. “ඔහුව එල්ලා මරා දමන්නයැ”යි රජු කීවේය.



ඉක්බිති රජු ජුදෙව්වන්ට තමුන්වම ආරක්ෂා කර ගැනීමට අවසර දෙමින් තවත් නීතියක් සම්මත කළේය. ඔවුහු ගැළවුනෝය! මොර්දෙකයි රජුගේ දෙවැනියා වූ අතර සියලු ජුදෙව්වන් ප්‍රීති වී එකිනෙකා අතර තෑගි හුවමාරු කර ගත්තෝය. රූමත් එස්තර් රැජින හරහා දෙවියන් වහන්සේ ඔවුන්ව බේරාගත් ආකාරය අදටත් ජුදෙව්වෝ මතක් කරති.



සුරුපි බිසව, එස්තර්

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

එස්තර්

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)